# ශ්‍රී ලංකාවේ කර්මාන්ත කිහිපයක ව්‍යාප්තිය ,ගැටලු හා ප්‍රවණතා

## ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ කර්මාන්තවල වැදගත්කම

- ශ්‍රී ලංකා ආර්ථිකයට කර්මාන්ත වලින් ලැබෙන පිටිවහල ක්ෂේත්‍ර කිහිපයක් ඔස්සේ හදුනා ගත හැකිය

1. **දළ දේශීය නිෂ්පාදිතය**

දළ දේශීය නිෂ්පාදිතයට ඇති දායකත්වය සහ සේවා නියුක්තිය - 2012

| | ප්‍රතිශතයක් ලෙස | ශ්‍රමික පිරිස මිලියන |
|---|---|---|
| කෘෂිකාර්මික අංශය | 11.1% | 2.5 |
| කාර්මික අංශය | 31.4% | 2.1 |
| සේවා අංශය | 57.5% | 3.5 |

ඉහත වාර්තාවට අනුව කාර්මික අංශයේ දායකත්වය 31.4% වන අතර සේවා නියුක්තිකයින් මිලියන 2.1 ක් වේ.එ අනුව කෘෂිකාර්මික,කාර්මික,සේවා යන අංශ 3න් දෙවෙනි ස්ථානය කාර්මික ක්ෂේත්‍රය හිමිකරගෙන ඇත

2. **සේවා නියුක්තිය**

ඉහත දත්ත වලට අනුව කාර්මික අංශයේ නියුතු සේවකයින් ප්‍රමාණය මිලියන 2.1 කි.සේවා නියුක්තියට අදාලව කාර්මික අංශය තෙවන ස්ථානය හිමිකරගෙන ඇත

3. **විදේශ විනිමය ඉපයීම**

විදේශ විනිමය ඉපැයීම

| | ඇමරිකන් ඩොලර් මිලියන | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| කෘෂිකාර්මික අපනයන | 2231.5 | 23.9% |
| කාර්මික අපනයන | 7371.2 | 75.4% |
| ඛනිජ හා වෙනත් අපනයන | 70.9 | 0.7% |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 2012

ඉහත දත්ත වලට අනුව කාර්මික ක්ෂේත්‍රයේ දායකත්වය සමස්ත අපනයන ඉපයීම වලින් 75.4% වේ.එය අනිකුත් අංශ හා සැසදීමේදී ඉදිරියෙන් සිටි.කාර්මික අපනයන ඉපයීම් අතර රෙදිපිළි හා ඇගලුම් අපනයනය කැපී පෙනේ

- **ක්‍රියාකාරකම**

1. "ශ්‍රිලංකාවේ ආර්ථික සංවර්ධනය කෙරෙහි කාර්මික අංශය වැදගත් වේ". නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න




